## අපේ සංවර්ධනය

මෙරට බොහෝ උගතුන් සිතන අයුරින් නම් දැනට ලොවේ රජයන බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ සංවර්ධනය සදාකාලිකව ඉණිමගක මෙන් පෙත්තෙන් පෙත්තට ඉහළ යනු ඇත. එමෙන් ම බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ද තව තවත් වර්ධනය වනු ඇත. මේ සංස්කෘතියත් සංවර්ධනයත් යන දෙකම යම් දිනෙක කඩා වැටෙන බව කී පමණින් ඇතැම්හු ඵ මාක්ස්වාදී හරඹයක් ලෙස දකිති. ඔවුන් ඇතැම් විට කියවා ඇත්තේ මාක්ස්වාදය ගැන ලියැවුණු ජනප්‍රිය පොත් පමණක් වුවත්, ඵ ඔස්සේ ධනවාදයේ කඩාවැටීමක් ගැන කියවන්නට අසන්නට ලැබී ඇති බැවින් මෙම සංස්කෘතික, නැතහොත් චින්තන කඩාවැටීම ද මාක්ස්වාදී ආකෘතිය අනුව ගෙතුණු එකක් ලෙස සලකති. එහෙත් සියළු සංස්කාර අනිත්‍ය බව දැනගැනීමට මාක්ස්වාදය මත පදනම් විය යුතු නො වේ.

ලෝකයේ සංස්කෘතීන් වර්ධනය වීම හා කඩා වැටීම ඉතිහාසය පුරා ම දැකිය හැකි ය. ඵ සෑම වර්ධනයක් ම කඩාවැටීමක් ම එකම අච්චුවකට දැමීම කෙසේ වෙතත් වහල් වැඩවසම් හා ධනවාදී සමාජ ක්‍රම කඩාවැටීම එකම අච්චුවකට දැමීමට මාක්ස්වාදයේ උත්සාහ කෙරෙයි. එවැනි උත්සාහයක් නොගත්ත ද වර්ධනය හා කඩාවැටීම ඕනෑම සංස්කෘතියකට, සමාජ ක්‍රමයකට වුව ද උරුම වූ ධර්මතාවක් බව බෞද්ධයනට තේරුම් ගැනීම අපහසුවක් නො වේ. අනෙක් රටවලින් දැනුම ලබාගෙන ස්වසිද්ධි හා ඇරිස්ටෝටලීය න්‍යාය මත නව දැනුමක් සකස්කරගත් ග්‍රීකයනට වුව ද අවුරුදු තුන් හාරසීයකට වැඩි කාලයක් බටහිර ලෝකයේ දැනුම් ආධිපත්‍යය පවත්වාගෙන යෑමට නො හැකි විය.

බටහිර දැනුම් පද්ධතියට ද එතරම් කාලයක් ආයුෂ ඉතිරි වී ඇතැයි සිතිය නො හැකි ය. බටහිර ගණිතයේ හා බටහිර භෞතික විද්‍යාවේ මතු වී ඇති අර්බුදවලට විසඳුම් නොමැත. ඵ අර්බුද මතු වී දැනට අවුරුදු හැත්තෑපහක් පමණ වුව ද එවා එසේ ම පවති. මේ අර්බුදවලට හේතුව ධනවාදය නම් නො වේ. ගණිතයේ ගර්ඩල් ප්‍රමේයය හෝ භෞතික විද්‍යාවේ ද්විත්ව සිදුරු පරීක්ෂණය හෝ ධනේශ්වර ආර්ථිකය මත පදනම් වූ දෑ නො වේ. ධනවාදය ද බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයෙහි ම ප්‍රතිඵලයකි. ඉහත සඳහන් අර්බුදවලට ප්‍රධාන හේතුව ද එම චින්තනය ම ය. එහෙත් එයින් අදහස් කෙරෙනුයේ සමස්ත සමාජ ක්‍රමයේ ම වර්ධනය හා කඩාවැටීම චින්තනයට ඌනනය කිරීමක් නො වේ. සමාජ ක්‍රමයක ආර්ථික දේශපාලනික හා සංස්කෘතික සංරචක වෙයි. ඵ එකිනෙකින් ස්වායත්ත නොවන අතර එකක කඩාවැටීම අනෙකට ද බලපායි.

සිංහල බෞද්ධ සමාජය ද සදාතනික වුවක් නො වේ. එහි ද වර්ධනයන් මෙන් ම කඩාවැටීම් දැකගත හැකි ය. එහෙත් අපේ සමාජයෙහි වටිනා කියමනක් වෙයි. අපි එහි තේරුම නිසියාකාරයෙන් අවබෝධ කරගෙන නැත්තෙමු. අපේ ප්‍රධාන සංකේත වනුයේ ඉර හා හඳ ය. අප ජීවත්වන්නේ ඉර හඳ පායන පොළොවක ය. මෙහි ප්‍රධාන වස්තු තුනක් වෙයි. ඵ ඉර, හඳ හා පොළොව ය. අප ජීවත්වන්නේ විශ්වයෙහි බවත් ඉර හඳ හා පොළොව එහි කුඩා වස්තු තුනක් පමණක් බවත් කිසිවකුට කිව හැකි ය. ඵ සැබෑ ය. විශ්වය ද කෙදිනක වුව විනාශ වෙයි. එහෙත් එයට පෙර ඉර හඳ නැතිවනු ඇත. අප මිනිසුන් ලෙස ජීවත්වන්නේ ඉර හඳ පවත්නා තෙක් මිස විශ්වය පවත්නා තෙක් නො වේ. විශ්වය විනාශ වීම යනු සියල්ල නැති වීම නො වේ. විශ්වය විනාශ වී වෙනත් විශ්වයක් ඇතිවන්නේ යැයි අපි විශ්වාස කරමු.

එහෙත් අපට විශ්වය විනාශ වීමට යන දීර්ඝ කාල පරිච්ඡේදය ගැන සිතන්නට අවශ්‍ය නොවන්නේ ඉර හඳ එයට පළමු විනාශ වන බැවිනි. ඉර හඳ නැතිවුවත් කෘත්‍රිම ව ශක්ත ජනනය කරගැනීමේ බහුබූත සිතිවිලි ඇතැම් විට බටහිරයනට ඇතිවිණි ද සිංහල බෞද්ධ සංස්කෘතියෙහි එවැනි සිතිවිලි ඇති නො වේ. ඉර හඳ ද නැති වී යන බව දන්නා අපි ඉර හඳ පවත්නා තෙක් ජීවත්වීමට (පැවතීමට) උත්සාහ කරමු. අපේ සංවර්ධනයෙහි පළමු සිතිවිල්ල එය යි. තමන් කිසිම දෙයක් අළුතින් කියා නැති උගතකු මේ ප්‍රකාශය ද ඊනියා ඌනිතවාදයකට ලඝු කිරීමට ඉඩ ඇත. ඵ ඔවුන් දන්නා ඌනිතවාදයක් නොමැති බැවිනි. මෙහි ඌනිතවාදයක් නැත. ඉර හඳ පවත්නා තෙක් ජීවත්වීම යන්නෙන් පටන්ගෙන අපට ඇරිස්ටෝටලීය න්‍යාය යොදාගෙන සංවර්ධනය පිළිබඳ ආකෘතියක් ගොඩනැගිය හැකි නො වෙයි.

ඉර හඳ පවත්නා තෙක් පැවතීම යන්න ස්වසිද්ධියක්, ප්‍රත්‍යක්ෂයක් නො වේ. ඉර හඳ නොමැතිව ජීවත්වීමට නොහැකි යැයි මම නොකියමි. එහෙත් ඵ සඳහා අති විශාල බලශක්තියක් නිෂ්පාදනය කිරීමට සිදුවනු ඇත. එවැනි කෘත්‍රිම ශක්තියක් නිපදවා ගත්ත ද ඵ හා සම්බන්ධ කෘත්‍රිම ජීවිතයක ඇති ඵලය කුමක් ද? ස්වසිද්ධියක් නොවූ ඉර

© Prof. Nalin De Silva

හඳ පවත්නා තෙක් ජීවත්වීම යන්න හුදු ප්‍රායෝගික ප්‍රකාශයක් හා බලාපොරොත්තුවක් පමණකි. අපට එවැනි බලාපොරොත්තුවක් පැතුමක් ඉටුකරගත හැකි ද? අපේ පැරැන්නන් එවැනි බලාපොරොත්තුවක් ඉටුකර ගැනීමට හැකි යැයි කල්පනාකර ඇති බව පෙනෙයි. එහෙත් පළමුව එවැනි ඉලක්කයක් කරා යැමට එවැනි පැතුමක් ඉටුකර ගැනීමට අපේ සංවර්ධනය සුදුසු ආකාරයෙන් සකස්විය යුතු ය.

ඉර හඳ පවත්නා තෙක් අප ජීවත්වන්නේ අහසෙහි නොව පොළොවෙහි ය. අහස් මාළිගා තැනීම හෝ එවාට ඇඟිලි දිගුකර පෙන්වීම දේශපාලනඥයන්ගෙ කාරයයක් විය හැකි ය. එහෙත් පොළොවෙහි ජීවත්වන අපට පොළොව වටිනා ම වස්තුවක් වෙයි. අපේ සංස්කෘතියෙහි පොළොව ඇතැම් විට මහා පොළොව ලෙස හැඳින්වෙයි. ඒ මහා බ්‍රිතානිය වැනි පම්පෝරි අර්ථයකින් නොව අපේ කුදු බව හා පොළොවෙහි වටිනාකම වටහා ගැනීමෙන් පැරණි සිංහලයන් විසින් තනා ගන්නා ලද යෙදුමක් විය හැකි ය. එසේත් නැතහොත් එය පෙරදිග පවත්නා සංකල්පයක් විය හැකි ය. ඒ කෙසේ වෙතත් ඉර හඳ පැවතුණ ද පොළොව විනාශ වුවහොත් අපට විසුමක් නැත. අප ජීවත්වන්නේ පොළොවෙහි දෙපා රුවාගෙන මිස අහසෙහි එල්ලෙමින් නො වේ.

පොළොව විනාශ වීම කිහිප ආකාරයකින් සිදුවිය හැකි ය. විශාල ධූම කේතුවක් වැනි වස්තුවක් පොළොව හා ගැටීමෙන් පොළොව විනාශ විය හැකි ය. බටහිරයන්ට නම් ඇත්තේ එවැනි බාහිර ගැටුම් පිළිබඳ අදහස් ය. ඈත අතීතයේ ජීවත් වී යැයි කියන ඩයනෝසිරස් නම් සත්ව වරගයා විනාශ වී ඇත්තේ එවැනි බාහිර ගැටුමක් නිසා යැයි ඇතැම් බටහිර විද්‍යාඥයෝ විශ්වාස කරති. එවැනි ගැටුමක් වී නම් වෙනත් ජීවී වරග ද කිහිපයක් වඳ වී යන්නට ඇත. එහෙත් බටහිර විද්‍යාඥයන්ට ඒ පිළිබඳ හෝඩුවාවක්වත් නැත. මම ප්‍රබුද්ධයෙක් නො වෙමි. අඩුම තරමින් සිනමා ශාලාවකට වැදී ජුරාසික් උයන්වල (පාක්) රවුම් ගැසීමේ අවශ්‍යතාවක් මට නැත.

පොළොව විනාශ වීම යනු එක් අතෙකින් ගත්කල පොළොව අපේ ජීවිතයට නුසුදුසු වීම ය. පොළොව යම් අයුරකින් සූරයයාට වඩා සමීප වුවහොත් හෝ සූර්‍යයාගෙන් වඩා ඈතට ගියහොත් හෝ අපට පොළොවේ ජීවත්වීමට නොහැකි වනු ඇත. එසේත් නැතහොත් අපට ම පොළොව විනාශ කළ හැකි ය. පරිසරය විනාශ කිරීම යනුවෙන් බටහිරයන් හඳුන්වන්නේ මිනිසුන් පොළොව විනාශ කිරීමේ එක් පැත්තක් පමණකි. බාහිර බලපෑම්වලින් තොරව අභ්‍යන්තර ක්‍රියාකාරිකම් නිසා සිදුවන වෙනස්කම් තේරුම් ගැනීමට බටහිරයන්ට නො හැකි ය. බටහිර විද්‍යාවේ පතාක යෝධයකු වූ අයිසැක් නිව්ටන් විද්වතා තම නමින් ඇති නියම පටන්ගන්නේ ම බාහිර බල ගැන සඳහන් කරමිනි. නිව්ටෝනීය භෞතිකයේ ඊනියා අභ්‍යන්තර බල ද බාහිර බල පමණක් ම බව කැලණිය විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික ගණිතය ඉගෙන ගන්නා සිසුහු දනිති.

පරිසරයට හානි සිදුකරන්නේ නැතහොත් පොළොව විනාශ කරන්නේ මිනිසා ය. වඩාත් නිරවුල් ව කියන්නේ නම් බටහිර මිනිසුන් හා ඔවුන් අනුකරණය කරන්නන් ය. එය භෞතික ව මෙන් ම ආධ්‍යාත්මික ව ද සිදුවිය හැකි ය. භෞතික ව පොළොව විනාශ කිරීම ගැන අපි නිතර කතා කරමු. කැලෑ කැපීමේ සිට නාගරික කුණු ප්‍රශ්නය හා ජලය අපවිත්‍ර කිරීම දක්වා ඒ පැතිරී ඇත. එහෙත් අප අධර්මිෂ්ට වන විට ද පොළොව විනාශ වේ යැයි අපි මොහොතක් වුව කල්පනා නො කරමු. ඒ අප ප්‍රබුද්ධයන් වී ඇති බැවිනි. බටහිර විද්‍යා ඉගෙන ගත්ත ද මා ප්‍රබුද්ධයකු නොවූ බැවින් මට බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් කැඩී වෙන්වීමට හැකි විය. ඊනියා ප්‍රබුද්ධයන්ට මට තරම්වත් ඒ චින්තනය නොතේරෙන බව ද මම දනිමි. අද බටහිරයෝ හා ඔවුන් අනුකරණය කරන්නෝ අභ්‍යන්තර ආධ්‍යාත්මික ගුණවගාවක් ගැන කතා නොකරති. නිව්ටන් විද්වතාගේ මුණුබුරු මිණිබිරියන් වූ මොවුන්ට හැකිනම් ආධ්‍යාත්මක සංවර්ධනය ද බාහිර සාධක මත සිදුවන්නක් බව පෙන්වනු ඇත. අපේ අධ්‍යාත්ම කුණු කර ගනිමින් අපට කිසිම භෞතික කුණු ප්‍රශ්නයක් නිසියාකාරව විසඳීමට නොහැකි වනු ඇත. අපට කළ හැක්කේ පැලැස්තර ඇළවීම පමණකි. එහෙත් පැලැස්තරය පසාකරගෙන කුණු ඕජස් ගලනු ඇත. ඉර හඳ පවත්නා තෙක් මහාපොළොවේ ජීවත්වීමට නම් අපේ සංවර්ධනයක් ඇති කරගත යුතු ය. විනාශ වීමට නියමිත බටහිර සංවර්ධනය පසුපස ගොස් අපට සුගතියක් අත් නොවනු ඇත. අපේ සංවර්ධනයේ භෞතික සංවර්ධනය ආධ්‍යාත්මික සංවර්ධනය සමග බැඳී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva